# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
# ඇබෑර්තු
# ගෘහපාලන සහායක තනතුර

---

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ ගෘහපාලන සහායක තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් **2020 සැප්තැම්බර් මස 11** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"ගෘහපාලන සහායක තනතුර"** යනුවෙන් සඳහන් කළ යුතුය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය)

1. **වැටුප් පරිමාණය:-** 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.25,520- 9x 270/10x 300/6x 330- 32,930 /- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාල අවම ආරම්භක දළ මාසික වැටුප රු. 57,000.00 පමණ වේ).

2. **වයස් සීමාව :-** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

3. **අධ්‍යාපන සුදුසුකම්:-** සිංහල හෝ දෙමළ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් ද ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

4. **වෘත්තීය සුදුසුකම්:-** ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) හෝ රජය විසින් පිළිගනු ලබන වෙනත් ආයතනයක, හෝටල් ගෘහ පාලනය, කාමර සේවක හෝ කාමර සහායක ක්ෂේත්‍රයේ මාස 05කට නොඅඩු පාඨමාලාවක සහතිකයක් ලබා තිබීම.

   හෝ

   හෝටල් ගෘහපාලනය, කාමර සේවක හෝ කාමර සහායක ක්ෂේත්‍රයේ NVQ Level 2 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

5. **පළපුරුද්ද :-** ඉහත (3) සහ (4) හි සඳහන් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව තරු පංතියේ හෝටලයක හෝටල් ගෘහ පාලනය, කාමර සේවක හෝ කාමර සහායක ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

6 **බඳවා ගැනීමේ ක්‍රමය :-** ලිඛිත/ වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

7 **සේවා නියමයන් හා කොන්දේසි:-**

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය

(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

**8.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඇ) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඇ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

**9.** රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

**10.** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**11.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
2020 අගෝස්තු මස 28 වැනි දින.